# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,457—1939ක්වූ ජූනි මස 9 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 2,060 (කළුතර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1939ක්වූ ජූනි මස 9වෙනි දින පටන් තුන් මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම් රජසන්තක ඉඩම්යයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩම් වශයෙන් ගෙන ඒවා කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1939ක්වූ මැයි මස 17වෙනි දින කළුතර කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කළුතර ආණ්ඩුවේ උප දිසාපතිතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උකස් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම්කෝරළේ කුඹුක්පත්තුවේ ගොඩිගමුව යන ගමේ පිහිටා තිබෙන පහත සඳහන් බිම්කට්ටි, එනම්:—

කැටූ මැනීමේ නො. A 841/K 125 දරන මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | කෝන්ගහවත්ත | .. | 0 1 4 |
| 2 | එම | .. | 0 3 23 |

මීට මායිම්—උතුරට කොළඹ දිස්ත්‍රික්කයේ මායිම සහ බී. ඩොන් පීරිස් විසින් අයිතිකම්කියාසිටින කෝන්ගහවත්ත; නැගෙනහිරට බී. ඩොන් පීරිස් විසින් අයිතිකම්කියාසිටින කෝන්ගහවත්ත; දකුණට ඇම්. ආරොන්සිංඤෝ විසින් අයිතිකම්කියාසිටින දෙල්ගහවත්ත නොහොත් මුකලානේවත්ත සහ එච්. අප්පුසිංඤෝ විසින් අයිතිකම්කියන පිංදෙනියේවත්ත; බස්නාහිරට එච්. අප්පුසිංඤෝ සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින පිඹුරු නො. 278,989 දරණ ආවාරි ගොඩැල්ල නොහොත් මුකලානේවත්ත.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්තනම; ඒනම්:—මහනුවර ආරෝග්‍යශාලාව ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 535. ගම—දෙයියන්නේවෙල (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 6 | සපුගස්පිටියේවත්ත (වරිපණම් නොම් වත්ත මරයක් නැත) | .. | මහනුවර නාගරික සභාව | .. 0 1 3·7 |
| 15 | නොම්බර 4රේ කොස්ටාසගේ ආරොහා මුඩුකිම ශාලාවට යන පාරේ වරිපණම් නො. 17 දරණ ඉඩමේ කොටසක් | .. | එම | .. 0 2 1·48 |

275——J. N. 84459—150 (5/39)
S 1

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 16 | හපුගස්පිටියේවත්ත, අංක 4රේ කොට්ඨාශයේ වරිපණම් අංක 25 | තාවකාලික පැල්වල් 2ක් සහ තාවකාලික ගෙවල් 2ක් තිබෙන වත්ත | මහනුවර කුඩුහුම්පොල ජේ නී කැනරීස් පදිංචිව සිටින මහනුවර නාගරික සභාවට අයිති ඉඩම | 0 3 20·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැනීම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සියලුදෙනාම තම්මන්ම හෝ තමන් වෙනුවට ක්‍රියාකරන අය ඊට 1939ක්වූ ජූලි මස 5වෙනි දින පෙරවරු 10ට කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මෙම 1939ක්වූ ජූනි මස 5වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

පී. ඇම්. රෙනිසන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

මෙම 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරව ආණ්ඩුවේ කැමැත්තෙන්, ඒ නම්:—ලංකාවේ විශ්වවිද්‍යාලයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "මෙම 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" කියමෙයි කාණ්ඩයේ තරනීවෙන පංචායේතුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේ නියමකාරය මට අණකැර තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ අංක. A 578. ගම—පල්ලේපේරාදෙණිය සහ මීවතුර.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | නිව්පේරාදෙනියවත්ත | අවුරුදු 40ක් පමණ වයසැති රබර් සහ අවුරුදු 30ක් පමණ වයසැති තේ, ස්ථිර බන්ගලෝවල් 2ක්, ගැරේජ් එකක්, ගලෙන්බැදි වතුර වැන්කි දෙකක්, ස්ථිර වැසිකිළි 2ක්, වතුරබඩ තුනක්, බන්ගලාවට පාරක්, ලින් දෙකක්, බැම්මක් සහ කානුවක්ද තිබේ | සීමාසහිත "ද සිලෝන් ලෑන්ඩ් ඇන්ඩ් ප්‍රොඩියුස්" නමැති සමාගම, ඒජන්තවරු: කොළඹ සීමාසහිත කාර්සන් මහතුන්ගේ සමාගම | 41 3 23 |
| 6 | — .. | වත්තේ පාර .. .. .. | එම | .. 0 1 6 |
| 7 | — .. | එම .. .. .. | එම | .. 0 0 33 |
| 8 | — .. | වතුරපාරක කොටසක් සහිත වත්තේ පාර .. | එම | .. 1 1 22 |
| 9 | නිව්පේරාදෙනියවත්ත | අවුරුදු 30කට වඩා වයසැති තේ, තැනින්තැන විසිරී තිබෙන පොල්ගස් කීපයක්, ස්ථිර රබර් සහ තේ පැක් ෆැක්ටරියක්, ස්ථිර බෙහෙත් ශාලාවක්, ළදරු නිවාසයක්, ආවුද මඩුවක්, කුළුනුපිට තැබූ යකඩින් සෑදූ වතුරපාරක්, වත්තේ පාරක්, ස්ථිර වැසිකිළි 4ක් සහ ඇලවල්දෙකක කොටස්ද තිබේ | එම | .. 16 0 19 |
| 10 | — .. | නැන්පත්කිරීමේ ඇලක් .. .. | එම | .. 0 2 3 |
| 11 | නිව්පේරාදෙනියේවත්ත | අවුරුදු 30කට වඩා වයසැති පොල්, රබර් සහ තේ, අවුරුදු 30කට වඩා වයසැති කොස්, ස්ථිර කෙල්වැන්කියක්, තාවකාලික වැසිකිළියක්, තාවකාලික මඩු 2ක්, ස්ථිර ගොඩනැගිලි 2ක්ද තිබේ | එම | .. 1 0 21 |
| 12 | නිව්පේරාදෙනියවත්ත නොහොත් උඩ වත්ත | අවුරුදු 40කට වඩා වයසැති රබර් සහ අවුරුදු 2ගේ සිට 10ට දක්වා වයසැති කොස්, අඹ, කොට්ට යනාදිය, ස්ථිර ගොඩනැගිලි 3ක් තාවකාලික හරක්ගාලක් සහ ස්ථිර වැසිකිළි 2ක්ද තිබෙන වත්ත | එම | .. 6 0 29 |
| 13 | නිව්පේරාදෙනියවත්ත | අවුරුදු 30කට වඩා වයසැති රබර් සහ පොල් තිබේ .. | එම | .. 2 2 1 |
| 14 | එම ... | අවුරුද්දේ සිට අවුරුදු 2 දක්වා වයසැති තේ (තැනින් තැන වවා තිබේ) | එම | .. 4 0 35 |
| 15 | එම .. | අවුරුදු 30කට වඩා වයසැති රබර් සහ පොල්, අවුරුදු 30කට වඩා වයසැති කොස් යනාදිය, කුලීලයින් 5ක්, ස්ථිර කෝවිලක්, ගලෙන් බැදි ළිදක්, වත්තේ පාරවල්, වතුර පයිප්පයක්, කුළුනුපිට තැබූ යකඩින් සෑදූ වතුර පාරක්, ස්ථිර ගෙයක්, තාවකාලික සෝල්ලයක්, තාවකාලික හරක් ගාල් 3ක්, ස්ථිර වැසිකිළි 3, රවුන් වතුර වැන්කියක්, ස්ථිර වතුර බැන්කියක් සහ ස්ථිර කුණු පුළුස්සන ස්ථානයක්ද තිබෙ [illegible] දෙනිය සහ වත්ත | එම | .. 6 2 19 |
| 16 | — .. | පොකුන සහ වෙල්ල, කුළුනුපිට සවිකර තිබෙන වතුර පාරක්ද තිබේ | එම | .. 1 0 21 |
| 17 | නිව්පේරාදෙනියවත්ත | අවුරුදු 30කට වඩා වයසැති රබර්, කුළුනුපිට සවිකර තිබෙන වතුර පාරක්, දියහලයක් සහ ස්ථිර වැසිකිළි 3ක්ද තිබේ | එම | .. 68 0 35 |
| 18 | — .. | වත්තේ පාර .. .. .. | එම | .. 0 1 36 |
| 19 | නිව්පේරාදෙනියවත්ත | අවුරුදු 30කට වඩා වයසැති රබර්, පාරක්, වතුර වැන්කියක්, ඇලක්, කුළුනුපිට සවිකර තිබෙන වතුර පාරක්, පාවිච්චිනොකර තිබෙන ජලාසයක්ද තිබේ | එම | .. 26 2 14 |
| 20 | එම .. | අවුරුදු 30කට වඩා වයසැති රබර්, පොල්, කොස් යනාදිය ගස් කීපයක් තිබෙන වත්ත, තාවකාලික හරක්ගාල් 7ක්, තාවකාලික ගෙයක්, ස්ථිර වැසිකිළි 2ක් සහ කුලීලයින් 2ක්ද තිබේ | එම | .. 1 1 31 |
| 21 | එම .. | අවුරුදු 40ක් පමණ වයසැති කොස් යනාදිය, අවුරුදු 40ක් පමණ වයසැති රබර්ගස් කීපයක්, කුලීලයින් එකක් සහ ස්ථිර වැසිකිළියක්ද තිබෙන වත්ත | එම | .. 1 1 33 |
| 24 | එම .. | අවුරුදු 30කට වඩා වයසැති තේ, වත්තේ පාරවල් සහ ස්ථිර වැසිකිළි 2ක්ද තිබේ | එම | .. 33 0 19 |
| 25 | එම .. | අවුරුදු 20ගේ සිට 25 දක්වා වයසැති තේ, වත්තේ පාරවල් සහ හොහොන්කොත් දෙකක්ද තිබේ | එම | .. 35 1 34 |
| 32 | එම නොහොත් උඩ වත්ත | අවුරුදු 30ගේ සිට 40 දක්වා වයසැති රබර් .. | එම | .. 39 0 31 |

පිළිවෙල් සිතියමේ අංක. A 578. ගම—මීවතුර.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 33 | උඩවත්ත නොහොත් නිව්පේරාදෙනිය වත්ත | අවුරුදු 28ක් පමණ වයසැති රබර් .. .. | එම | .. 38 1 4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන 1939ක්වූ ජූලි මස 8වෙනි දින පෙරවරු 9ටේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. එක් එක්කෙනාගේ උරුමය සම්බන්ධ තිබෙන ඔප්පුද ගෙනඑන්ට ඕනෑය.

වන 1939ක්වූ ජූනි මස 3වෙනි දින, මහනුවර කච්චේරියේදීය.

ජී. වී. ඩිසිසන්,
ආණ්ඩුවේ ඒජන්ත වන්නා.

---

වන 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යයක්හට, ඒනම්:—ලබිකාගේ විශ්වවිද්‍යාලයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වන 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතෙවනි කාණ්ඩයේ කරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 578. ගම—පල්ලේපේරාදෙනිය සහ මීවතුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | නිව්පේරාදෙනියවත්ත, වර්පනම් නො. 524 සහ 524A, නො. 3 කේ කොටසය | අවුරුදු 20ක් වයසැති රබර්ගසක්, අවුරුදු 3ක් වයසැති කෙසෙල් පඳුරු 6ක් සහ පැපොල්ගස් 4ක්ද, වැන්නි දෙකක්ද තිබේ | වත්තේගම මීගම්මන සී. ඒ. ලේන් මහතා .. | 0 3 9 |
| 4 | රජවත්ත .. | අවුරුදු 10ගේ සිට 40 දක්වා වයසැති රබර්, අවුරුදු 20ක් පමණ වයසැති තේ, අවුරුදු 10ගේ සිට 35 දක්වා වයසැති පොල්, අත්හැරදමා තිබෙන කුඹුරක් සහ තාවකාලික මඩු 3ක්ද තිබේ | කොළඹ බුලර්ස්පාරේ සිටිනා ඇම්. ඉස්මයල් මහතා සහ ඇම්. ඒ. රසාක් සහ ඉසැඩ්. ඒ. රසාක් යන මහතුන් | 5 3 36 |
| 22 | නිව්පේරාදෙනියවත්ත | අවුරුදු 3 සිට 40 දක්වා වයසැති පොල්, අඹ යනාදිය, ස්ථිර බංගලාවක් සහ ගැරෙජ් එකක් සහ වැසිකිළියක්ද තිබේ | නිව්පේරාදෙනියවත්තේ එච්. ෆ්‍රේසර් නෝනා | 2 9 29 |
| 23 | — .. | වත්තේ පාර .. .. | එම .. .. | 0 0 29 |
| 26 | ඔල්ඩ්පේරාදෙනියවත්ත | අවුරුදු 10 සිට 30 දක්වා වයසැති තේ | සිඹාගනිත රජවැල්ල සහ සමාගම්, ඒජන්තවරු සිඹාගනිත ගෝර්ඩන් ෆ්‍රේසර් සහ සමාගම | 14 0 15 |
| 28 | කුරුදුගොඩැල්ල .. | කෙසෙල් පඳුරු කීපයක් තිබෙන ලඳුකැලේ | එම .. .. | 0 1 38 |
| 29 | පහලතැන්න .. | කුඹුර .. | පේරාදෙනියේ හිඳගල පදිංචි හේරත්මුදියන්සේලාගේ කළුබන්ඩා, එම පිකිරිමැතිගේ, එම කළුබන්ඩා | 0 3 16 |
| 30 | එම .. | එම .. .. | මහනුවර මල්වත්තේ පත්සලේ බෙන්තර දේවමිත්ත තෙරුන් | 1 2 0 |
| 31 | රිවර්සයිඩ්වත්ත .. | අවුරුදු 40ක් වයසැති තේ සහ පොල්, අවුරුදු 40ක් වයසැති කොස් ලුවක යනාදියද තිබේ | පේරාදෙනියේ රිවර්සයිඩ්වත්තේ සිටින ඇතල් ප්‍රනාන්දු සහ කටුකැලේ නො. 152 නිවසේ සිටින ජෝර්ජ් ප්‍රනාන්දු | 6 3 18 |

මුල් සිතියමේ නො. A 578. ගම—මීවතුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 34 | වලකාඳෙනිය .. | කුඹුරක්, අවුරුදු 25කට වඩා වයසැති කොස්ගස් 2ක්, තාවකාලික ගොඩනැගිල්ලක්, වැසිකිළියක් සහ ලිඳක්ද තිබේ | මීවතුරේ අගලකොටුවේගෙදර සියාතු, එම මුදියන්සේ, එම පුන්චිරාල, එම රන්හාමි, එම කිරිහාමි, එම කිරිමැතියන්, එම පුන්චිබන්ඩා, එම උක්කුබන්ඩා | 1 2 20 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන 1939ක්වූ ජූලි මස 8වෙනි දින පෙරවරු 9.30ගේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. එක් එක්කෙනාගේ උරුමය සම්බන්ධ තිබෙන ඔප්පුද ගෙනඑන්ට ඕනෑය.

වන 1939ක්වූ ජූනි මස 3වෙනි දින, මහනුවර කච්චේරියේදීය.

ජී. වී. ඩිසිසන්,
ආණ්ඩුවේ ඒජන්ත වන්නා.

---

වන 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යයක්හට, ඒනම්:—මාතලේ දිස්ත්‍රික්කේ වාරිමාර්ගයක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වන 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතෙවනි කාණ්ඩයේ කරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රන සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 557. ගම—වරකාමුරේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අස්වැද්දුමේකුඹුර .. | කුඹුර (අත්හැරදූ) .. | නුර් මොහමිඩු ලෙබ්බේ, අකුරණ .. | 0 0 7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන 1939ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11ගේ කනිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වන 1939ක්වූ ජූනි මස 2වෙනි දින, මාතලේ කච්චේරියේදීය.

ආර්. එච්. බී. මැක්බර්න්,
ආණ්ඩුවේ උප ඒජන්ත වන්නා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—හුලන්දව සිට ඔපානට යන දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ පාරේ අත්තර සහිත වංගුවක් පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අවසාන ගම් සිතියමේ නො. 5. අතිරේක නො. 2. ගම—ගොරකාවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 59 | ගුරුබැබිලදෙනිය .. | පාර .. | ගොරකාවල පදිංචි සුමේරු ආචාරීගේ බාර්ලිස්හාමි | 0 0 3·4 |
| 60 | එම .. | කුඹුර .. | එම .. .. | 0 0 1·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ ජූලි මස 4වෙනි දින පෙරවරු 10යේ කාලයට මොරවක ගම්සභා ශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑම් සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ මැයි මස 31වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇම්. රාජපක්ෂ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ත්‍රිකුණාමලේ අළුත් නැපැල් කන්තෝරුව යනාදිය සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස 203 පරිච්ඡේදයවූ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කාරුණය පිට පළාත් ආණ්ඩු කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A. 373. ගම—ත්‍රිකුණාමලේ පළාත් ආණ්ඩු සභා මායිම්තුලවූ ත්‍රිකුණාමලේ 1වෙනි කොට්ඨාශය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | (නො. 181, 182 හා 183 දරණ අයබදු බිම්වල කොටස්වන) මෝල්ස් වර්ත්වලවූ | ජරාවාසවූ ගලෙන් බඳිනලද පුරාණ ලිඳක්ද, වයස අවුරුදු 35ක් පමණවූ තල්ගස් 42ක්ද, පොල් ගසක් හා සූරියගස් 19ක්ද ඇති පුරාණ වත්ත | ජී. ඇස්. ඇල්මෝල්ස්වර්ත්ගේ උරුමක්කාරයෝ වෙනුවට ක්‍රියාකරණ මහනුවර නල්වත්තේ පදිංචි ඇම්. ඒ. වෙස්ට්ලන්ඩ් මැතිණිය | 1 0 38·57 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ ජූලි මස 14වෙනි දින පෙරවරු 11ට ත්‍රිකුණාමලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූනි මස 6වෙනි දින
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

සී. ජේ. ඔබින් ලෑන්ක්‍රි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගම්මුන්ට දෙනලද ඉඩම්වලට පාරක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩු කාරක මන්ත්‍රි සභාමට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

උපුටාගන්නාලද 1 කොටස. මුල් සිතියමේ නො. 438. ගම—වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනි හත්පත්තුවේ උඩුකහ නැගෙණහිරකෝරළේ පහලවැත්තෑව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 34 | වැත්තෑවේවත්ත .. | පොල්වත්ත .. | කඳුනේ, ගෙදරපිටියේ පදිංචි ඇම්. බී. ජේම්ස් අප්පුහාමි | 0 0 20·3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ ජූලි මස 19වෙනි දින පෙරවරු 10යේ කාලයට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූනි මස 3වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇල්. ඇස්. බී. පෙරේරා,
වයඹ පළාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නාකාගෙවෙසෙලේ ඇල වැඩිදියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාමට උතුමාණන්වහන්සේගෙන් පැවරීතිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අනුරාධපුර නගර මැනීමේ මුල් සිතියමේ නො. 14 B. නො. 8වේ අතිරේකය. ගම—අනුරාධපුර නගරය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1109 | මල්වතුඔයවතත, නො. 2 කොට්ඨාසයේ වරිපනම් නො. 621 කොටසක් | වත්ත, පොල්ගස් දෙකක් තිබේ | නුවරඑලියේ එච්. බී. කිරිමැටියාව .. | 0 0 13·6 |
| 1110 | පාර, නො. 2 කොට්ඨාසයේ වරිපනම් නොම්මරයක් නැත | පාර, ඇලක් තිබේ .. | වොසසින්ට හෝනා, ගල්කිස්සේ ස්රේ සත් පාර | 0 0 1·5 |
| 1111 | මල්වතුඔයවතත, නො. 2 කොට්ඨාසයේ වරිපනම් නො. 622යේ කොටසක් | මුඩුබිම, ඇලක් තිබේ .. | එම .. .. | 0 0 0·6 |
| 1112 | මල්වතුඔයවතත, නො. 2 කොට්ඨාසයේ වරිපනම් නො. 623 කොටසක් | වත්ත, පුවක්ගස් 11ක් තිබේ | අනුරාධපුරේ කේ. යූ. අන්දිරිස් අප්පුහාමි | 0 0 15·1 |
| 1113 | මල්වතුඔයකුඹුර, නො. 2 කොට්ඨාසයේ වරිපනම් නො. 624යේ කොටසක් | කුඹුර සහ පුවක්ගස් 18 තිබෙන වත්ත | කැකිරාවේ බී. පොන්නකෝන් හිටපු රාළේ මහත්මියා | 0 0 31 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1114 | මල්වතුඔයකුඹුර, නො. 2 කොටස සහ වරිපනම් නො. 639 යේ කොටසක් | කුඹුර, ඇලක් තිබේ .. | වෙලුප්පුල්ලේ සෙල්ලදුරෙයි සිලම්බතුරෙයි, මන්නාරම | 0 | 0 | 30·8 |
| 1115 | මල්වතුඔයකුඹුර, නො. 2 කොටස සහ වරිපනම් නො. 638 කොටසක් | කුඹුර (අත්හැර තිබේ), ඇළේ කොටසක් | අනුරාධපුරේ පී. බී. ගල්ගමුව .. | 0 | 0 | 4 |
| 1116 | එම .. | කුඹුර (අත්හැර තිබේ) | එම .. .. | 0 | 0 | 1·2 |
| 1117 | පාර, නො. 2 කොටසය .. | පයිප්ප බෝක්කුවක් තිබෙන පාර | එම .. .. | 0 | 0 | 1·1 |
| 1118 | මල්වතුඔයකුඹුර, නො. 2 කොටස සහ වරිපනම් නො. 638 කොටසක් | කුඹුර (අත්හැර තිබේ) සහ පොකුන | එම .. .. | 0 | 0 | 14·7 |
| 1119 | මල්වතුඔයකුඹුර, නො. 2 කොටස සහ වරිපනම් නො. 636 කොටසක් | කුඹුර, ඇළේ කොටසක් | අනුරාධපුරේ කේ. යු. අන්දිරිස් අප්පුහාමි | 0 | 0 | 38·5 |
| 1120 | මල්වතුඔයකුඹුර, නො. 2 කොටස සහ වරිපනම් නො. 635 කොටසක් | එම .. | පේද්‍රුරුතුඹුවේ ඇම්. සිවප්‍රකාසම් .. | 0 | 0 | 32·5 |
| 1124 | මල්වතුඔයකුඹුර, නො. 2 කොටස සහ වරිපනම් නො. 634 කොටසක් | දෙනිය .. | අනුරාධපුරේ වී. සිඩිනපුල්ලේ .. | 0 | 0 | 4·4 |
| 1126 | සින්හපන්කුලිය, නො. 2 කොටස සහ වරිපනම් නො. 642 කොටසක් | මුඩුබිම, ඇළේ කොටසක් | යාපනේ නැගෙණහිර තිරුනාවෙලියේ අයියම්පුල්ලේගේ උරුමක්කාරයෝ | 0 | 0 | 9·2 |

උතුරු මධ්‍යම දිසාවේ නුවරගම්කෝරළේ පංකුලියේ නො. 524 දරන මුල් සිතියමේ නො. 1 දරන අතිරේකය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 29 | පන්කුලියවත්ත .. | අවුරුදු 15 සිට 20 දක්වා වයස ඇති පොල්ගස් 4ක් තිබෙන වත්ත | අනුරාධපුරේ වී. සිඩිනාපිල්ලේ .. | 0 | 0 | 3 |
| 35 | පන්කුලියකුඹුර .. | කුඹුර .. .. | මානිපේ ඇස්. සරවනමුත්තු .. | 0 | 0 | 3·4 |
| 38 | එම .. | මුඩුබිම, ඇලක් තිබේ .. | එම .. .. | 0 | 0 | 7 |
| 39½ | එම .. | මුඩුබිම .. | එම .. .. | 0 | 0 | 2·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1939ක්වූ ජුලි මස 3වෙනි දින පස්වරු 2.30ට කාලයේ අනුරාධපුර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ ඒ සියි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1939ක්වූ මැයි මස 31වෙනි දින
අනුරාධපුරේ කච්චේරියේදීය.

ඒ. ඊ. ක්‍රිස්ටෝෆල්ස්,
උ. ම. ප. ආණ්ඩුවේ ඒජන්ත වම්ත.

---

## ඉඩම් සංවිධාන කිරීමේ දැන්වීම.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස රඹුක්කන තානායමේදී 1939ක්වූ ජුලි මස 7වෙනි දින පූ. භා. 10ට 1935 අංක 19 දරන ඉඩම් සංවිධාන කිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කැමති ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු කමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විචාරාගතයුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

### දීමට යන ඉඩම්වල විස්තර.

ප්ලෑන් අංකය F. V. P. 135. ගම—කුඩාගම.

| කැබෙල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 266 .. | ඇස්. අගෝස්තිනු .. | 0 | 3 | 32 |
| 272 .. | පිරමානාගේ පේදුරු .. | 1 | 0 | 9 |
| 273 .. | මෙරගල්ගෙ ඊසාක් .. | 1 | 0 | 36 |
| 285 .. | රන්හොටිගේ ඊසාක් .. | 0 | 3 | 24 |
| 289 | දේවකාගේ සිපිරියානු .. | 1 | 0 | 37 |
| 291 .. | රන්හොටිගේ සියා .. | 0 | 3 | 24 |
| 292 .. | රන්හොටිගේ තිමෝතියස් .. | 0 | 3 | 28 |

ප්ලෑන් අංකය F. V. P. 147. ගම—පදවිගම්පොල.

| කැබෙල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 61, 62 .. සහ 63 | විදුහරල්ලාගේ කිරිබංඩා .. | 1 | 0 | 22 |
| 67 සහ 68 | මීදෙනියේගේ නයිලාගේ කිරිබබා . | 0 | 3 | 26 |
| 71 .. | හොබනගලාගේගෙදර මාලිංග .. | 1 | 0 | 3 |
| 77 .. | ආර්. ඇම්. උක්කුබංඩා .. | 1 | 0 | 7 |
| 81 .. | ආර්. රන්කිරා .. .. | 1 | 0 | 14 |
| 89 .. | ඇස්. ඒ. සයිමෝන් .. | 1 | 0 | 6 |
| 90 .. | වී. ඩී. කවුම්ා .. .. | 1 | 0 | 1 |
| 91 .. | යිටිගෙදර පුංචිරාල .. | 0 | 3 | 33 |
| 92 .. | ඇස්. ජෝතියා .. .. | 1 | 1 | 5 |
| 93 .. | ඩබ්ලිව්. ඩී. අල්ලිසා .. | 0 | 3 | 29 |
| 94 .. | ඩබ්ලිව්. ඩී. අගෝතිසා .. | 0 | 3 | 30 |
| 95 .. | ඒ. සොමලියා .. | 1 | 0 | 36 |
| 99 | ඩබ්ලිව්. පුංචිබණ්ඩා .. | 1 | 0 | 10 |
| 101 .. | එච්. බී. අප්පුහාමි .. | 1 | 0 | 35 |
| 102 .. | එච්. ආර්. පුංචිඅප්පුහාමි .. | 1 | 0 | 11 |
| 103 .. | ඒ. පුංචිමැණිකා . .. | 1 | 0 | 17 |
| 104 .. | ආර්. ඇම්. පුගනන්සිංඤෝ .. | 1 | 0 | 22 |
| 106 .. | ඒ. ඇම්. පුංචිඅප්පුහාමි .. | 1 | 0 | 16 |
| 107 .. | ඊ. අප්පුහාමි .. .. | 1 | 1 | 9 |
| 110 .. | සී. ඒ. පෙරේරා .. .. | 1 | 1 | 8 |
| 111 .. | පී. ඒ. පුංචිරාල .. .. | 1 | 0 | 8 |
| 112 .. | එච්. බී. කිරිබංඩා . | 1 | 0 | 20 |
| 113 .. | එච්. ඇම්. හිංගිරිඅප්පුහාමි .. | 1 | 0 | 27 |
| 114 .. | බී. ආර්. මුදියන්සේ .. | 1 | 0 | 27 |
| 115 .. | ඇන්. බඩුන්සිංඤෝ .. | 1 | 1 | 34 |
| 118 .. | ඒ. රිකිරිමැනිකා .. | 1 | 0 | 4 |
| 119 .. | කේ. කිරියා .. .. | 0 | 3 | 35 |
| 120 .. | ඇම්. ඒ. හිංගිරිඅප්පුහාමි .. | 0 | 3 | 35 |
| 121 .. | එච්. මුදලිහාමි .. .. | 1 | 0 | 13 |
| 126 .. | ජී. පිකිරිබංඩා .. .. | 1 | 1 | 9 |
| 124 .. | එච්. බී. පුංචිබංඩා .. | 0 | 3 | 34 |
| 125 .. | ඇල්. හිංගිරිබංඩා .. | 1 | 0 | 26 |
| 130 .. | ආර්. ඇම්. කිරිබංඩා .. | 1 | 0 | 18 |
| 84 .. | ඇස්. ඒ. සිමියන් සිංඤෝ . | 1 | 0 | 22 |

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම්වල මිනිරන් හෑරීමේ බදු විකිණීමයි.

වර්ෂ 1939ක්වූ ජූනි මස 22වෙනි දින සවස 2ට තංගල්ලේ කාර්යාලයේදී මෙහි පහත සඳහන්වන ඉඩමේ මිනිරන් හෑරීම පිණිස පස් අවුරුද්දේ බද්ද හම්බන්තොට උප ඒජන්තතුමා විසින් මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මේ ඉඩමේ බද්ද වැඩියෙන් ඉල්ලුම්කරුට ලැබේ. එහි තක්සේරු මුදල අක්කරයක් රුපියල් එක්සිය පණහක් වේ (Rs. 150).

2. මේ විකිණීම කරන්නා යම් කෙනෙකුගේ ඉල්ලීමක් පිළිගැනීමට ප්‍රථමයෙන් ඔහුගේ ඉල්ලීම සැබෑ ඉල්ලීමක්ද කියා විශ්වාසයක් කරගත යුතුයි. මෙසේ අවිශ්වාසයක් ඇති ඉල්ලීම් නොපිළිගනී.

3. වැඩිය ඉල්ලුම්කරුට බද්ද තීන්දුවූවිට ඔහු විසින් ඒ මුදලෙන් සියයට දහයක් එතැනදී ගෙවිය යුතුයි. විකුණුම් කොන්දේසි දැක්වෙන ලිපියක්ද ඔහු විසින් අත්සන්කළ යුතුයි. මුදල් නොගෙවා ඒ ලිපියද අත්සන් නොකළොත් විකිණීම අවලංගුවේ. විකිණීම අවලංගුවූවිට ඒ ඉඩමේ බද්ද නැවත වරක් වෙන්දේසිකරනවා ඇත. මෙසේ වෙන්දේසි කරනවිට පළමු ඉල්ලුම්කරුට ඉල්ලීමට අවසර නොදේ.

4. ඉඩදෙනලද කාලසීමාව ඇතුළතදී සම්පූර්ණ මුදල ගෙවිය යුතුයි. ඒ මුදල ගෙවූවිට ඔහුට ඉඩම භාරදේ. ඉන්පසු පහත දැක්වෙන කොන්දේසි අඩංගුකරනලද මිනිරන් හෑරීමට අවසර ඇති ඔප්පුවක් ඔහුට දෙනුවා ඇත.

(i.) මේ බද්දේ කාලය අවුරුදු 5ක් වේ. බදුකාරයාට උවමනානම් තවත් පස් අවුරුද්දකට බද්ද අලුත් කරගත හැක. මෙසේ අලුත්කිරීමේදී ඒජන්තතුමාට උවමනා කොන්දේසි බදුකාරයාගේ අවසර ඇතුව එහි අඩංගුකරන්ට බලය තිබේ. බදුකාරයාට බද්ද අත්හැර දැමීමට උවමනා නම් ඒ බව මාස හයකට ප්‍රථමයෙන් ඒජන්තතුමාට දැන්විය යුතුයි.

(ii.) ලේඛන ගතනොවූ දඬු මේ ඉඩමේ තිබේනම් ඒවා බදුකාරයාට ඒ ඉඩමේ වැඩවලට ගැනීමට අවසර තිබේ. ඒ කෙසේදයත් ඒ දඬු උප ඒජන්තතුමාගේ අවසරයක් නැතුව ඉඩමෙන් පිටතට ගෙනයාම තහනම්ය.

(iii.) මිනිරන් හැර වෙන කිසිදෙයක් මේ ඉඩමෙන් හෑරීම තහනම්ය.

(iv.) මේ සඳහන්වන කොන්දේසි පිළිපැදීමට බදුකාරයා විසින් අක්කරයට රුපියල් සියයක් (Rs. 100) ගණනේ ඇප තැබිය යුතුයි.

(v.) මෙහි පහත සඳහන්වන ගණන් දෙකෙන් වැඩි ගණනක් බදුකාරයා විසින් අවුරුදුපතා උප ඒජන්තතුමාට ගෙවිය යුතුයි.

(*a*) අවුරුද්දතුළ මේ ඉඩමෙන් සොයාගත්තාවූ මිනිරන්වල වටිනාකමෙන් සියයට තුනක්; හෝ

(*b*) බදු දෙනලද ඉඩමේ අක්කරයකට හෝ ඉන් කොටසකට රුපියල් දෙසියයක් (Rs. 200) බැගින්ද වේ

5. මේ බද්ද විකිණීමෙන් පසු, බදු ඔප්පුව දීමට ප්‍රථමයෙන් මෙය වැරදීමකින් සිදුවී හෝ, ආණ්ඩුවට ඉතාම උවමනාවන ඉඩමක් කියා හෝ, ඒජන්තතුමාට වැටහී ගොස් තිබේනම් මේ විකිණීම ඔහු විසින් අවලංගුකරනු ලැබේ. මෙසේවූවිට ගැනුම්කාරයා විසින් ආණ්ඩුවට යම් මුදලක් මේ සම්බන්ධව ගෙවා තිබේනම් ඒ මුදල ආපසු දෙනවා ඇත. නුමුත් ගැනුම්කාරයාට ආණ්ඩුවෙන් අලාභනාසි අයකරගැනීමට බලය නැත.

6. බදු ඔප්පුව ලෑස්තිකර බදුකාරයාට යැවූවිට දවස් දහයක් ඇතුළතදී එය අත්සන්කර ආපසු එවිය යුතුයි. තවද බදු ඔප්පුව ලෑස්තිකර බදුකාරයාට පිටත් නොකර එය අත්සන්කිරීම පිණිස යම් ස්ථානයකට ඔහුට පැමිණෙන්වය කියා අණකළොත් එතනට පැමිණිය යුතුයි. මෙසේ නොපැමිණ සිටියොත් විකිණීම අවලංගුකෙරේ. විකිණීම අවලංගුවූ විගසම ඔහුවිසින් ආණ්ඩුවට ගෙවනලද මුදල් සියල්ලම රජසන්තක කෙරේ. ඉඩමේ කරනලද වැඩවලට හෝ වෙන කිසි දෙයකට ගැනුම්කාරයාට ආණ්ඩුවෙන් අලාභය අයකර ගැනීමට බලය නැත.

ඉහත විස්තරකරනලද ඉඩම

| ලොට් නො. | ප්‍රමාණය, අ. රූ. ප. | අවසාන සිතියමේ නො. | ගම. |
|---|---|---|---|
| 31 | 1 1 30 | 318 | මාරකොල්ලිය |

ඩබ්ලිව්. හොලම්ස්,
උප ඒජන්තතුමා.

වර්ෂ 1939ක්වූ ජූනි මස 6වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912යේ අංක 8 දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### රත්නපුර දිස්ත්‍රික්කයේ 1938–1939, රා රේන්ද නැවත විකිණීම.

වර්ෂ 1939යේ ජූලි මස 1වන දින පටන් 1939යේ සැප්තැම්බර් මස 30වන දිනට අවසන්වන කාලයතුළ පහත උප ලේඛනයේ සඳහන් ස්ථානයේ රා විකිණීමේ බලය මුදලට ගැනීම සඳහා "ටැන්ඩර්" හෙවත් ඉල්ලුම්පත්‍ර 1938වේ මැයි මස 11 වන දින නො. 8,368 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නො. 329 දරණ සුරාබදු දැන්වීමේ සඳහන් කොන්දේසිවලටද, එකී ගැසට් පත්‍රයේම පළවූ 1938–1939යේ රා රේන්ද විකිණීම සම්බන්ධ කොන්දේසිවලටද යටත්ව වර්ෂ 1939 ජූනි මස 24වෙනි සෙනසුරාදා පෙරවරු 10.30ට සබරගමු පළාතේ ඒජන්තතුමා විසින් රත්නපුරේ කච්චේරියේදී භාරගනු ලැබේ.

2. සෑම "ටැන්ඩර්" පත්‍රයක්ම නියමිත ආකෘතිපත්‍රයක ලියා එවිය යුතුවා පමණක් නොව ඊට රුපියල් 100ක් මහා භාණ්ඩාගාරයට හෝ කච්චේරියකට ගෙවා ලබාගත් කුවිතාන්සියක් අමුණා තිබිය යුතුයි.

3. "ටැන්ඩර්" ආකෘතිපත්‍ර මෙහි පහත සඳහන් කන්තෝරුවලින් ලබාගත හැක:—

1. මහා භාණ්ඩාගාරය, කොළඹ.
2. සුරාබදු කොමසාරිස් මහතාගේ කන්තෝරුව, කොළඹ.
3. බස්නාහිර කොට්ඨාශයේ සුරාබදු උප කොමසාරිස් මහතාගේ කන්තෝරුව, කොළඹ.
4. රත්නපුරේ සුරාබදු සුපරින්ටැන්ඩන්ට් මහතාගේ කන්තෝරුව.
5. කොළඹ කච්චේරිය.
6. රත්නපුරේ කච්චේරිය.
7. බදුල්ල කච්චේරිය.
8. කළුතර කච්චේරිය.
9. කෑගල්ල කච්චේරිය.

4. 1939යේ ජූනි මස 24 වන දින නියමිත වේලාවට පැමිණ නොසිටියොත් කිසිවෙකුගේ "ටැන්ඩර්" පත්‍රයක් සලකා බැලීමට ගනු නොලැබේ. "ටැන්ඩර්" පත්‍රයක් කලින් තැපෑලෙන් එවිය හැක. නමුත් එසේ එවනවිට කවරේ සීල්තබා එය මතු පිට "රා රේන්ද ටැන්ඩර්" කියා රතු තීන්තෙන් ලියා තිබිය යුතුයි.

5. තෝරාගනුලැබූ ඉල්ලුම්කරු විසින් ඔහු බලය ලැබූ තැනැත්තා හැටියට ප්‍රකාශකළ විගසම විකිණීමේ කොන්දේසි අත්සන්කළ යුතුවා පමණක්නොව ඇපයක් වශයෙන් ඒජන්තතුමා ළඟ දෙමාසයක රේන්ද මුදල හා සමවූ මුදලක් <u>මුදලින්ම</u> තැන්පත්කළ යුතුයි.

6. වැඩිදුර කරුණු රත්නපුරේ කච්චේරියෙන් ඉල්ලා ලබාගත හැක.

1939යේ ජූනි මස 7වන දින
රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඇම්. ඩේවිස්,
සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

උප ලේඛනය.

| තැබෑරුමේ නො. | කොට්ඨාශය. | ස්ථානය. | "ටැන්ඩර්" පත්‍ර භාරගන්නා වේලාව. |
|---|---|---|---|
| 2 | කොළොන්නා කෝරළය | උලිඳුවාවිගම | පෙරවරු 10.30 |

### රත්නපුර දිස්ත්‍රික්කයේ 1939–40යේ රා රේන්ද විකිණීම.

මේ 1939යේ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1940යේ සැප්තැම්බර් මස 30වෙනි දිනට අවසන්වන කාලයතුළ පහත උප ලේඛනයේ සඳහන් ස්ථානවල රා විකිණීමේ බලය මුදලට ගැනීම සඳහා "ටෙන්ඩර්" නොහොත් ඉල්ලුම්පත්‍ර මේ 1938වේ මැයි මස 11වෙනි දින නො. 8,368 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නො. 329 දරණ සුරාබදු දැන්වීමේ සඳහන් කොන්දේසිවලටද, 1939 අප්‍රේල් මස 28වෙනි දින නො. 8,448 දරණ ගැසට් පත්‍රයේ පළවූ 1939–40යේ රා රේන්ද විකිණීම සම්බන්ධ කොන්දේසිවලටද යටත්ව මේ 1939යේ ජූනි මස 30වෙනි සිකුරාදා පහත සඳහන් වේලාවල්වලදී සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් රත්නපුර කච්චේරියේදී භාරගනු ලැබේ.

2. සෑම "ටෙන්ඩර්" පත්‍රයක්ම නියමිත ආකෘතිපත්‍රයක ලියාඑවිය යුතුවා පමණක් නොව ඊට බලන්ගොඩ තැබෑරුම් වෙනුවෙන්නම් රු. 250ක්ද, අනිත් එක එක තැබෑරුම් වෙනුවෙන් හෝ එකක් හැටියට විකුණන තැබෑරුම් කඳක වෙනුවෙන් නම් රු. 100ක්ද කොළඹ මහා භාණ්ඩාගාරයට හෝ කච්චේරියකට ගෙවා ලබාගත් කුවිතාන්සියක් අමුණා තිබිය යුතුයි.

3. "ටෙන්ඩර්" ආකෘතිපත්‍ර මෙහි පහත සඳහන් කන්තෝරුවලින් ලබාගත හැක :—

1. මහා භාණ්ඩාගාරය, කොළඹ.
2. සුරාබදු කොමසාරිස් මහතාගේ කන්තෝරුව, කොළඹ.
3. බස්නාහිර කොට්ඨාසයේ සුරාබදු උප කොමසාරිස් මහතාගේ කන්තෝරුව, කොළඹ.
4. රත්නපුරේ සුරාබදු සුපිරින්ටෙන්ඩන්ට් මහතාගේ කන්තෝරුව.
5. කොළඹ කච්චේරිය.
6. රත්නපුර කච්චේරිය.
7. බදුල්ල කච්චේරිය.
8. කළුතර කච්චේරිය.
9. කෑගල්ල කච්චේරිය.

4. 1939යේ ජූනි මස 30වෙනි දින නියමිත වේලාවට පැමිණ නොසිටියහොත් කිසිවෙකුගේ "ටෙන්ඩර්" පත්‍රයක් කල්පනාවට ගනු නොලැබේ. "ටෙන්ඩර්" පත්‍රයක් කලින් තැපෑලෙන් එවිය හැක. නුමුත් එසේ එවනවිට කවරය සීල් තබා එය මතුපිට "රා රේන්ද ටෙන්ඩර්" කියා රතු තීන්තෙන් ලියා තිබිය යුතුයි.

5. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු විසින් ඔහු බලය ලැබූ තැනැත්තා හැටියට ප්‍රකාශකළ වහාම විකිණීමේ කොන්දේසි අත්සන්කළ යුතුවා පමණක් නොව ඇපයක් වශයෙන් ඒජන්තතුමා ලඟ දෙමාසයක රේන්ද මුදල හා සමවූ මුදලක් මුදලින්ම තැන්පත්කළ යුතුයි.

6. වැඩිදුර කරුණු රත්නපුරේ කච්චේරියෙන් ඉල්ලා ලබාගත හැක.

1939ක්වූ ජූනි මස 6වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

ආර්. ඇම්. ඩේවිස්,
සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

උප ලේඛනය.

| තැබෑරුමේ නො. | කොට්ඨාසය. | | ස්ථානය. | | "ටෙන්ඩර්" පත්‍ර භාරගන්නා වේලාව |
|---|---|---|---|---|---|
| 1 | මැදකෝරළය | .. | බලන්ගොඩ සනීපාරක්ෂක නගරය තුල | .. | පස්වරු 1.15 |
| 2 | නවදුන්කෝරළය | .. | කදුරුගෙලවත්තගම තුල | .. | පස්වරු 1.45 |
| 3 | කඩවත්කෝරළය | . | පින්නවලගම තුල | .. | පස්වරු 2.15 |
| 4 | කඩවත්කෝරළය | .. | මොරහැලගම තුල | .. | පස්වරු 2.15 |
| 5 | කොළොන්නාකෝරළය | .. | උලිඳුවංගම තුල | .. | පස්වරු 2.45 |

### රත්නපුර දිස්ත්‍රික්කයේ 1939–40යේ අරක්කු රේන්ද විකිණීම.

මේ 1939යේ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1940යේ සැප්තැම්බර් මස 30වෙනි දිනට අවසන්වන කාලයතුළ පහත උප ලේඛනයේ සඳහන් ස්ථානවල අරක්කු බෝතලපිටින් හා බෙදා විකිණීමේ බලය මුදලට ගැනීම සඳහා "ටෙන්ඩර්" නොහොත් ඉල්ලුම්පත්‍ර මේ 1938වේ මැයි මස 11වෙනි දින නො. 8 368 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නො. 329 දරණ සුරාබදු දැන්වීමේ සඳහන් කොන්දේසිවලටද, මේ 1939යේ ජූනි මස 9වෙනි දින නො. 8,457 දරණ ගැසට් පත්‍රයේ පළවූ 1939–40යේ අරක්කු රේන්ද විකිණීම සම්බන්ධ කොන්දේසිවලටද යටත්ව මේ 1939යේ ජූනි මස 30වෙනි සිකුරාදා පහත සඳහන් වේලාවල්වලදී සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් රත්නපුර කච්චේරියේදී භාරගනුලබනවා ඇත.

2. සෑම "ටෙන්ඩර්" පත්‍රයක්ම නියමිත ආකෘතිපත්‍රයක ලියාඑවිය යුතුවා පමණක්නොව ඊට බලන්ගොඩ තැබෑරුම වෙනුවෙන්නම් රු. 250ක්ද, පින්නවල තැබෑරුම වෙනුවෙන්නම් රු. 100ක්ද කොළඹ මහා භාණ්ඩාගාරයට හෝ කච්චේරියකට ගෙවා ලබාගත් කුවිතාන්සියක් අමුණා තිබිය යුතුයි.

3. "ටෙන්ඩර්" ආකෘතිපත්‍ර පහත සඳහන් කන්තෝරුවලින් ලබාගත හැක :—

1. මහා භාණ්ඩාගාරය, කොළඹ.
2. සුරාබදු කොමසාරිස් මහතාගේ කන්තෝරුව, කොළඹ.
3. බස්නාහිර කොට්ඨාසයේ සුරාබදු උප කොමසාරිස් මහතාගේ කන්තෝරුව, කොළඹ.
4. රත්නපුරේ සුරාබදු සුපිරින්ටෙන්ඩන්ට් මහතාගේ කන්තෝරුව.
5 කොළඹ කච්චේරිය.
6. රත්නපුරේ කච්චේරිය.
7. බදුල්ලේ කච්චේරිය.
8 කළුතර කච්චේරිය.
9 කෑගල්ල කච්චේරිය.

4. 1939යේ ජූනි මස 30වෙනි දින නියමිත වේලාවට පැමිණ නොසිටියහොත් කිසිවෙකුගේ "ටෙන්ඩර්" පත්‍රයක් කල්පනාවටගනු නොලැබේ. "ටෙන්ඩර්" පත්‍රයක් කලින් තැපෑලෙන් එවියහැක නුමුත් එසේ එවනවිට කවරේ සීල්තබා ඒ මතුපිට "අරක්කු රේන්ද ටෙන්ඩර්" කියා රතු තීන්තෙන් ලියා තිබිය යුතුයි.

5. තෝරාගනුලැබූ ඉල්ලුම්කරු විසින් ඔහු බලයලැබූ තැනැත්තා හැටියට ප්‍රකාශකළ වහාම විකිණීමේ කොන්දේසි අත්සන්කළ යුතුවා පමණක්නොව ඇපයක් වශයෙන් ඒජන්තතුමා ලඟ දෙමාසයක රේන්ද මුදල හා සමවූ මුදලක් මුදලින්ම තැන්පත්කළ යුතුයි.

6. වැඩිදුර කරුණු රත්නපුරේ කච්චේරියෙන් ඉල්ලා ලබාගත හැක.

1939ක්වූ ජූනි මස 3වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

ආර් ඇම්. ඩේවිස්,
සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

උප ලේඛනය.

| තැබෑරුමේ නො. | කොට්ඨාශය. | | ස්ථානය. | | "ටෙන්ඩර්" පත්‍ර භාරගන්නා වේලාව. |
|---|---|---|---|---|---|
| 1 | මැදකෝරළය | .. | බලන්ගොඩ සනීපාරක්ෂක නගරය තුළ | .. | පෙරවරු 11 |
| 2 | කඩවත්කෝරළය | .. | පින්නවලගම තුළ.. | .. | පෙරවරු 11.30 |

### සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කරණකොටගෙන මෙසින් ප්‍රකාශකරන්නේනම් යාපනය, මන්නාරම් සහ මුලතිව් දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය මේ 1939ක්වූ ජූලි මස 3වෙනි දින පෙරවරු 11 පැය පටන් යාපනේ නගර සාලාවේදී පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසරඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුස්සන් බවත් මෙසින් සෑමදෙනාටම දන්වන්නෙමි.

මේ 1939ක්වූ ජූනි මස 5වෙනි දින
යාපනේ පිස්කල් කන්තෝරුවේදීය.

ඇස්. තුරෙසිඅප්පා,
පිස්කල්තුමා වෙනුවට.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.